 ISSN 2362-0412

# නව සංවර්ධන ව්‍යාපෘති සහ පරිසර කළමනාකරණය: හම්බන්තොට මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිත ප්‍රත්‍යයික අධ්‍යයනයක්

නිෂාදි තාරකා මාරසිංහ*, අයි. රේණුක ප්‍රියන්ත

*රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර*

*Corresponding author: *nishadimarasinghe1995@gmail.com*

***සංක්ෂේපය***

සංවර්ධනය ක්‍රියාවලිය තුළ රටක තිරසාර පැවැත්ම තීරණය වන්නේ විවිධ මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති ජනතා කේන්ද්‍රීය සහ පරිසර හිතවාදී එළැඹුමකින් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම හරහා ය. මෙහිදී මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති මිනිසාගේ සංවර්ධනයට පමණක් නොව සමස්ථ ජෛව පැවැත්මට ද සෘජුව බලපෑම් එල්ල කරති. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවලට මුහුණ පෑමට සිදුව ඇති තීරණාත්මක අභියෝගය වී ඇත්තේ කාලගුණ වෙනස්කම් සහ ඒ හේතුකොට ගෙන නිර්මාණය වී ඇති අවතැන් වූවන්ගේ ගැටළුවයි. වරින් වර බලයට පත්වන ආණ්ඩු පාලනය සහ ඒකාබද්ධ නො◌ාවූ ප්‍රතිපත්තීන් හේතු කොටගෙන මෙම තත්ත්වය තීව්‍රකිරීමට හේතු වී ඇති බව පහැදිලි ය. ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව 1980 අංක හතළිස් හත දරණ පරිසර පනත මගින් හා එහි සංශෝධන පනත් මගින් පරිසරය සම්බන්ධව කටයුතු කිරීමට අදාළ නීති විධිවිධාන දක්වා තිබුණ ද අද වන විට බොහාමයක් සංවර්ධන ව්‍යාපෘතිවල අර්බුධකාරී තත්ත්වයන් නිර්මාණය වී තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ පරිසර කළමනාකරණයේ අභියෝගාත්මක මුහුණුවර විශ්ලේෂණය කිරීමයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදාගනු ලැබුවේ මත්තල ගුවන් තොටුපොළ ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක් වූ හම්බන්තොට  ගොන්නොරුව ප්‍රදේශයයිග මිශ්‍ර අධ්‍යයන ක්‍රමය යොදා ගනිමින් පර්යේෂණය සිදුකළ අතර ප්‍රාථමික සහ ද්විතික දත්ත ඒ සඳහා උපයෝගී කර ගනු ලැබීය. තෝරාගත් පවුල් 150 ක් ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මගින් අධ්‍යායනයට යොදා ගනිමින් දත්ත රැස්කිරීම සිදු කරන ලදි. මෙහිදි ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රමය ඔස්සේ ද ගුණාත්මක දත්ත උද්ගාමී ප්‍රවේශය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදිග  සංවර්ධන ව්‍යාපෘතිවලට පෙර සහ පසුතත්ත්වයන් විමසා බැලීම මෙන්ම පාරිසරික කළමනාකරණය වෙත අවධානය යොමු නොකිරීම නිසා පාරිසරික වශයෙන් ජනතාව සහ පරිසරය මුහුණ දෙන ගැටලු ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි විය. දිගු කාලීන පාරිසරික ඇගයීම් වාර්තාවකින් තොරව නිර්මාණය කරන ලද මත්තල ගුවන්තොටුපළ ව්‍යාපෘතිය විශාල පාරිසරික හානියට මන් විවර කර ඇති බව මෙම අධ්‍යයනයේ දී තහවුරු වියග  පූර්ව පරිසර වාර්තාවට අනුව පරිසර කළමනාකරණය සිදුවිය යුතු වුවත් එවැන්නක් සිදුව ඇති බවක් අධ්‍යායනය මගින් අණාවරණය නොවීයග අධ්‍යයනයෙන් තහවුරු වූයේ පාරිසරික කළමනාකරණ තීන්දු ගැනීම ඒකාබද්ධ රාමුවක සිදුකර නොගැනීම නිසා එහි අතුරු ප්‍රතිවිපාක ලෙස වනඅලි ගැටුම ද නිර්මාණය වී ඇති බවයිග

**Keywords:** *පරිසරය, පරිසර කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, සංවර්ධනය, සංවර්ධන ව්‍යාපෘති*